## කාලගුණය

උපරිම උෂ්ණත්වය

31°C රත්මලාන

අවම උෂ්ණත්වය

14°C නුවරඑළිය

සුළං තත්ත්වය

නිරිතදිග බෙංගාල බොක්ක ආශ්‍රිතව පැවති ගැඹුරු පීඩන අවපාතය, දෙසැම්බර් 03 දින සුළි කුණාටුවක් දක්වා වර්ධනය වී උතුරු අක්ෂාංශ 11.4° සහ නැගෙනහිර දේශාංශ 82.5° ආසන්න ප්‍රදේශයේ, යාපනයේ සිට කි.මී. 325 ක් පමණ ඊසාන දෙසින් පැවතුණි. මෙම සුළි කුණාටුව "මිජවුම්" (MICHAUNG) ලෙස නම් කර ඇති අතර එය ශ්‍රී ලංකාවේ උතුරු වෙරළට ආසන්නයෙන් වයඹ දෙසට ගමන් කරමින් උතුරු තමිල්නාඩුව දෙසට ගොස් පසුව උතුරු දෙසට ගමන් කර 2023 දෙසැම්බර් 05 දින වන විට දකුණු අන්ද්‍රා ප්‍රදේශයේ වෙරළ තීරයෙන් ගොඩබිමට ඇතුළුවනු ඇතැයි බලාපොරොත්තුවේ.

මුහුදේ තත්ත්වය

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

අද

කර්තෘ මණ්ඩලය

ලිපිනය:
අංක 08, හුණුපිටිය හරස් පාර, කොළඹ 02.

දුරකථන:
2479670, 2479671

ෆැක්ස්:
2479668

විද්‍යුත් තැපෑල:
ada@wijeya.lk / adanewspaper@gmail.com

වෙළෙඳ දැන්වීම් අංශය:
011 2479 830

බෙදාහැරීමේ අංශය:
011 2479 625

දායකත්ව අංශය:
011-2479 626

අද

පාඨක අයිතීන් සුරැකීම

අද පුවත්පත ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත සහයෝගය දක්වයි.

මේ පුවත්පතෙහි සේවා කරන කර්තෘ ඇතුළු පත්‍රකලාවේදීන් සියලු දෙනම 'පාඨක අයිතීන් සුරැකීම' සහ පුවත්පත් පැමිණිලි කොමිසම මඟින් ක්‍රියාවට නංවන 'කර්තෘ සංසදයට' අදාල ආචාර ධර්ම සුරැකීමට නිබඳව බැඳී සිටිති. පුවත්පතේ පළකෙරෙන ප්‍රවෘත්තියක් නිසා ඔබට සිදුවන යම් අපහසුතාවක් පිළිබඳ අප පුවත්පත දැනුම්වත් කිරීමට අවස්ථාව ඇත.

ඒ පිළිබඳ ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, 'ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම' වෙතද ඔබේ පැමිණිල්ල ඉදිරිපත් කළ හැකිය.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
Press Complaints of Sri Lanka

96, කිරුළ පාර, කොළඹ 05.

| | |
|---|---|
| දුරකතනය | 5 353 635 |
| ෆැක්ස් | 5 335 500 |
| ඉමේල් | pccsl@pccsl.lk |
| වෙබ් | www.pccsl.lk |

# MICHAUNG සුළි කුණාටුව නිසා නැගෙනහිර මුහුදු ගමන් අවදානම්

ඉන්දික හේවාවිතාරණ

"මිජවුම්" (MICHAUNG) සුළි කුණාටුව නිසා මන්නාරම සිට කන්කසන්තුරය, ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල යාත්‍රා කිරීම අවදානම් බැවින් ඊළඟ දැනුම් දෙන තුරු එම මුහුදු ප්‍රදේශයට යාත්‍රා නොකරන ලෙස කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ධීවර සහ නාවික ප්‍රජාවන් ඉල්ලා සිටියි.

ගාල්ල සිට මාතර හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල අවධානයෙන් කටයුතු කරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටින අතර "මිජවුම්" (MICHAUNG) සුළි කුණාටුව හෙට (05දා) දිනය වන විට දකුණු අන්ද්‍රා ප්‍රදේශය වෙත ගමන් කිරීමට නියමිත බවත් පෙන්වා දෙයි.

නිරිතදිග බෙංගාල බොක්ක ආශ්‍රිතව පැවති ගැඹුරු පීඩන අවපාතය, සුළිකුණාටුවක් ලෙස වර්ධනය වී උතුරු අක්ෂාංශ 11.4° සහ නැගෙනහිර දේශාංශ 82.5° ආසන්න ප්‍රදේශයේ,එනම් යාපනයේ සිට කි.මී 325ක් පමණ ඊසාන දෙසින් පවතින අතර මෙම සුළි කුණාටුව ශ්‍රී ලංකාවේ උතුරු වෙරළට ආසන්නයෙන් වයඹ දෙසට ගමන් කරමින් උතුරු තමිල්නාඩුව දෙසට ගොස් පසුව උතුරු දෙසට ගමන් කර දකුණු අන්ද්‍රා ප්‍රදේශයේ වෙරළ තීරයෙන් ගොඩබිමට ඇතුළුවනු ඇතැයි බලාපොරොත්තුවන බවද සඳහන් කරයි. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ධීවර හා නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටියි.


අද පුත්තලම සිට මන්නාරම, කන්කසන්තුරය සහ ත්‍රිකුණාමලය හරහා මඩකලපුව දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැකි බවත්, දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැකි බවත් පෙන්වා දෙයි.

මන්නාරම සිට කන්කසන්තුරය, ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැයට කිලෝමීටර් 60-70 දක්වා වැඩි විය හැකි බවත්, ගාල්ල සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැයට කිලෝමීටර් 50-60 දක්වා වැඩි විය හැකි බවත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

අද උතුරු සහ උතුරු-මැද පළාත්වලත්, ත්‍රිකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්කවලත් විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැකි බවත්, එම ප්‍රදේශවල ඇතැම් ස්ථානවලට මිලිමීටර් 75ට වැඩි තරමක තද වැසි ද ඇතිවිය හැකි බවත් පෙන්වා දෙයි.

සෙසු ප්‍රදේශවල සවස 1.00න් පමණ පසු තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැකි බවත්, බස්නාහිර සහ වයඹ පළාත්වල සහ ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල උදෑසන කාලයේදී ද වැසි ඇති විය හැකි බවත් සඳහන් කරයි.

ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළංවලින් සහ අකුණු මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටියි.




# අධිකරණයෙන් කල්මුණේ ළමා නිවාසයකට භාරදුන් 14 හැවිරිදි දරුවෙකුව ඝාතනය කරලා

## - ළමා නිවාසයේ පාලිකාව අද දක්වා රිමාන්ඩ්

අම්පාර වසන්ත චන්ද්‍රපාල

කල්මුණේ ළමා නිවසායක රඳවාසිටි පිරිමි දරුවෙකු පහරදී ඝාතනයට කළැයි අත්අඩංගුවට ගත් ළමානිවාසයේ පාලිකාව අම්පාර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අද (04දා) දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස වැඩබලන මහේස්ත්‍රාත්වරයා ඊයේ (03දා) නියෝග කළේය.

මෙලස රිමාන්ඩ්ගත කෙරුණේ, එම ළමා නිවාසයේ 25හැවිරිදි වියේ පසුවන පාලිකාවකි.

හොරකමක් සම්බන්ධයෙන් මඩකලපුව, කොකුවිල් පොලීසිය මගින් සැකපිට අත්අඩංගුවට ගෙන මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබා දී තිබූ නියෝගයක් අනුව කල්මුණේ ප්‍රදේශයේ පිහිටි ළමා නිවාසයක රඳවා සිටි 14 හැවිරිදි පිරිමි දරුවකු පහර කෑමෙන් ඝාතනය වී ඇති බව අම්පාර දිස්ත්‍රික්කයේ උසස් පොලිස් නිලධාරියෙක් පැවසීය.

මෙම දරුවාව අලුයම 3.30 ට කල්මුණේ අෂ්රෆ් අනුස්මරණ රෝහල වෙත රැගෙනවිත් ඇතත් ඒ වනවිටත් දරුවා මියගොස් සිටි බව වෛද්‍යවරු සඳහන් කළහ.

මේ අතර දරුවාගේ සිරුරේ ඇති තුවාල සලකුණු හේතුවෙන් දෙමාපියන් මරණය සම්බන්ධයෙන් සැක පළ කළ තිබේ.

පසුව දරුවාගේ සිරුර පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා අම්පාර මහ රෝහලට යවා ඇති අතර අධිකරණ වෛද්‍යවරයාගේ වාර්තාවෙහි සඳහන් වන්නේ මොට ආයුධයකින් පහරදීම නිසා තුවාල තිබූ බවත්, මරණය අභ්‍යන්තර තුවාල හේතුවෙන් සිදුවූවක් බවත් සඳහන් ය.

පසුව මෙම දරුවාගේ ඝාතනය සම්බන්ධයෙන් එම ළමා නිවාසයේ 25 හැවිරිදි වියේ පසු වන පාලිකාව කල්මුණේ පොලීසිය විසින් සැකපිට අත්අඩංගුවට ගෙන තිබේ.

මෙම දරුවා රාත්‍රී ආහාරයෙන් පසුව නින්දට ගිය අතර ඉන් පසුව කුමක් සිදුවුණාදැයි තමන් නොදන්නා බව ඇය පොලීසියට පවසා තිබේ.

මෙසේ ඝාතනය කර ඇත්තේ මඩකලපුව කොක්අඩිචෝලේ ප්‍රදේශයේ පදිංචි ඒ.ටී දර්ශන නමැති ළමයෙකි.

නැගෙනහිර දිසාව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතාගේ උපදෙස් මත, අම්පාර කොට්ඨාස භාර පොලිස් අධිකාරී නන්දන ජයපත්ම මහතාගේ මෙහෙයවීමෙන් කල්මුණේ සහකාර පොලිස් අධිකාරී ටී.එච්.ටී.එම්.එල්. බුද්ධික මහතාගේ අධීක්ෂණයෙන් වැඩිදුර පරීක්ෂණ පැවැත්වෙයි.

# හන්තානේදී මංමුලා වූ රාගම වෛද්‍ය පීඨයේ සිසුන් 180ක් පැය 6ක මෙහෙයුමකින් සොයා ගැනේ

## - සිවුදෙනෙකු ප්‍රතිකාර සඳහා මහනුවර රෝහලට





ගම්පොළ - සුරංග දිල්හාන්/ෂේන් සෙනෙවිරත්න

ක්ෂේත්‍ර චාරිකාවක් සඳහා හන්තාන කන්ද තරණය කළ රාගම වෛද්‍ය පීඨයේ සිසු සිසුවියන් 180 දෙනකු සවස් කාලයේ පැවති අධික මීදුමත් සමග මංමුළා වීම හේතුවෙන් පොලීසිය සහ යුද හමුදාව එක්ව සිදුකළ පැය 06ක මෙහෙයුමකින් පසු ඔවුන් සියලු දෙනා මුදා ගැනීමට හැකිව තිබේ .

එසේ මුදා ගත් සිසුන් දෙදෙනකු සහ සිසුවියන් දෙදෙනෙකු ප්‍රතිකාර සඳහා මහනුවර ජාතික රෝහලට ඇතුළත් කොට තිබේ . සිසුවියන් 120 දෙනෙකු සහ සිසුන් 60 දෙනකුගෙන් සමන්විත එම වෛද්‍ය ශිෂ්‍ය කණ්ඩායම පෙරේදා (02දා) පෙරවරුවේ හන්තාන කඳු තරණය ආරම්භ කොට ඇති අතර සවස් කාලය වනවිට හන්තාන කන්දේ ඉහළ කොටසට පතිත වී ඇති අධික මීදුම හේතුවෙන් මාර්ග සොයාගැනීමට නොහැකිව ඔවුන් මංමුළා වී තිබේ .

කිසිවක් කර කියා ගැනීමට නොහැකි වූ සිසුන් රාත්‍රියේ පොලිස් හදිසි ඇමතුම් ඒකකයට (119) දැනුම් දී ඇති අතර ඒ අනුව ක්‍රියාත්මක වූ පොලීසිය සහ යුද හමුදාව එක්ව සිදුකළ සෝදිසි මෙහෙයුමකින් පසු සිසුන් කණ්ඩායමෙන් සිය දෙනෙකුට ආසන්න පිරිසක් නිරුපද්‍රිතව පහළට ගෙන ඒමට හැකි ව තිබේ .කණ්ඩායමේ අනෙක් පිරිස ඊයේ (03) පාන්දර 02.00 ට පමණ මුදා ගැනීමට හැකි වූ බවද පොලීසිය කියයි .

# ජනවාරියේ සිට රු. 20,000ක් ඉල්ලා රාජ්‍ය සේවකයෝ 12දා වැඩවර්ජනයක

ඉන්දික හේවාවිතාරණ

රාජ්‍ය සේවකයන්ට ජනවාරි මාසයේ සිට රුපියල් විසිදහසක දීමනාවක් ලබාදෙන ලෙස ඉල්ලා හා තවත් ඉල්ලීම් කිහිපයක් මුල්කර ගනිමින් මේ මස 12වන දින එක්දින වැඩවර්ජනයක් සිදුකරන බව රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවා වෘත්තීය සමිති එකමුතුව සඳහන් කරයි.

ජනතාව ගැන සිතා එදින සෞඛ්‍ය, අධ්‍යාපනය හා ප්‍රවාහන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට සම්බන්ධ රාජ්‍ය සේවකයන් මෙම වැඩවර්ජනයට සම්බන්ධ නොවන බවත් එහෙත් ඉන්පසුව ක්‍රියාමාර්ග සිදුකිරීමට සිදුවුවහොත් මෙම ක්ෂේත්‍රයේ වැඩවර්ජනවලට සම්බන්ධ වන බවද එම එකමුතුවේ කමිටු සාමාජික ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ නියෝජ්‍ය ලේකම් චන්දන සූරියආරච්චි මහතා සඳහන් කළේය.

ලබන 12 වන දින සිදුකරන එක්දින වැඩවර්ජනයට සමගාමීව දිස්ත්‍රික්ක 25 මූලික කර ගනිමින් විරෝධතා ව්‍යාපාර 25ක් සිදුකරන බවත් රජයේ සංඛ්‍යාලේඛනවලට අනුව මේ වන විට සිවුදෙනෙකුගෙන් යුත් පවුලක මාසික වියදම රුපියල් ලක්ෂය ඉක්මවා ගොස් තිබෙන බවත් එහෙත් රාජ්‍ය සේවක අවම වැටුප රුපියල් තිස්දහසක මුදලක් බවද පවසා සිටියේය.

ලබන 13වන දින අයවැය ලේඛනයට අදාළ ඡන්ද විමසීම් පැවැත්වෙන බවත් ඊට පෙර 20,000 දීමනාව ලබා දෙන යෝජනාව අයවැයට ඇතුළත් කර ගැනීම සඳහා 12වන දින එක්දින වැඩවර්ජනය හා විරෝධතා 25ක් සිදුකරන බවත් 13වන දින ලැබෙන තීරණයට අනුව ඉදිරි ක්‍රියාමාර්ග සිදුකරන බවද සඳහන් කළේය.

වැන්දඹු හා අනත්දරු අරමුදලට අයකර ගන්නා මුදල් ඉහළ දමා තිබෙන බවත්, එම තීරණය අහෝසි කළ යුතු බවත්, 2016 වසරින් පසු අහිමි කර තිබෙන පූර්ණ විශ්‍රාම වැටුප නැවත ලබා දිය යුතු බවත්, 2014 වසරේදී අහිමි කළ ශ්‍රේණි උසස් ක්‍රමය නැවත ක්‍රියාත්මක කළ යුතු බවත් හෙතෙම පවසා සිටියේය.

# උතුරු මැද පළාතේ පාසල් 28ක ඉඩම් ව්‍යාපාරිකයන් විසින් අත්පත් කරගෙන

## -රජය විසින් පාසල් සඳහා වෙන්කර පවරා දී ඇති කුඹුරු ඉඩම් සහ ඔප්පුත් අතුරුදන් - ලංකා ගුරු සංගමය

අනුරාධපුර විශේෂ - ඩී.ජී. චතුරංග

උතුරු මැද පළාතේ පිහිටි පාසල් 28ක රුපියල් කෝටි ගණනක් වටිනා පාසල් පොදු ඉඩම් පුද්ගලික ව්‍යාපාරිකයන් සහ විවිධ අය විසින් අත්පත් කර තිබෙන බවත්, රජය විසින් පාසල් සඳහා වෙන්කර පවරා දී ඇති කුඹුරු ඉඩම් සහ එහි ඉඩම් ඔප්පුද අතුරුදන් වී ඇති බවත් ලංකා ගුරු සංගමය පවසයි.

ඊයේ (3දා) අනුරාධපුරයේ දී පැවති මාධ්‍ය හමුවකදී මේ කරුණු අනාවරණය කළ ලංකා ගුරු සංගමයේ සභාපති ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා පැවසුවේ, මහවැලි එච් කලාපයේ සහ මහවැලි එල් කලාපයේ, ගොඩනැඟිලි ද සහිතව පාසල් සඳහා පවරා දුන් ඉඩම් සහ ගොඩනැගිලිද මේ වන විට ඇතැම් පිරිස් අත්පත් කර ගෙන ඇති බවය.

දේශපාලන බලපෑම් මත ඉතා ඉහළ නිලධාරීන්ගේ මැදිහත්වීම හා ආශිර්වාද ලැබීම, හේතුවෙන් මෙවැනි තත්ත්වයක් උද්ගත වී ඇති බැවින් මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කර විසඳුම් ලබා දීමට කටයුතු කරන බවද හෙතෙම පෙන්වා දුන්නේය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා මෙසේද කීය.

"නාගරික පාසල්වල වටිනා ඉඩම් විධිමත් මැනීම් හෝ සිදු වී නොමැති කම හේතුවෙන් පුද්ගලයන් විසින් එම පාසල් ඉඩම් වැඩි වශයෙන් අල්ලාගෙන තිබෙනවා. ඇතැම් පිරිස් මේ කතා කරන මොහොත වන විටත් සමහර පාසල්වල ඉඩම් අල්ලා ගනිමින් සිටිනවා.

මේ වන විට අනුරාධපුර ශාන්ත ජෝසප් විදුහලේ රුපියල් කෝටි ගණනක් වටිනා පර්චස් 20ක පමණ ප්‍රමාණයක් වසර කිහිපයක් තිස්සේ පුද්ගලයකු විසින් අත්පත් කරගෙන තිබෙනවා. මේ හේතුවෙන් පාසල් භූමිය තුළ කෝටි හයහමාරක වියදමින් ඉදි කළ පාසල් පිහිනුම් තටාකයට පිවිසීමට ඉඩක් නොමැති වී තිබෙනවා. මෙය වර්ෂ 1800 ගණන්වල දී කතෝලික 'මීසමට' අයිතිව තිබී. පසුව ඉඩම පාසලට භාර දී තිබෙන ඉඩමක්.

මේ පිවිසුම වසා දැමීම පුද්ගලික ව්‍යාපාරිකයෙකු තමයි සිදු කර තිබෙන්නේ. මේ කොල්ලය පිටුපස මන්ත්‍රීවරයකු සිටින බව වගකීමෙන් කියනවා. අධික වටිනාකමක් ඇති මේ බිම් ප්‍රමාණය නැවත ලබා දීමට අනුරාධපුර ප්‍රාදේශීය ලේකම්වරයා උත්සාහ කළ ද එය වැළැක්වීමට මේ වන විටත් දේශපාලඥයකු තදින්ම ක්‍රියා කරමින් සිටිනවා. දිඹුලාගල විලයාය පාසලේ කුඹුරු ඉඩමක්,නොච්චියාගම මහවැලි අධිකාරිය ගොඩනැගිලිද සහිතව පැවරූ ඉඩමක් ආදී පාසල් ඉඩම් රැසක් මේ ආකාරයෙන් කොල්ලකා තිබෙනවා. මිනුම් කටයුතු සිදු කර නොදීම මෙයට විශේෂ හේතුවක්.

මේ ව්‍යසනය වළක්වා ගැනීමට දිසාපතිවරු, ප්‍රාදේශීය ලේකම්වරු සහ අධ්‍යාපන අමාත්‍යංශය වහාම මැදිහත් වන ලෙස විශේෂ ඉල්ලීමක් කරනවා.අධ්‍යාපන අමාත්‍යවරයාගෙන් යහපත් ප්‍රතිචාර නොලැබෙන්නේ නම් ජනාධිපතිවරයාගේ හෝ අවධානයට යොමු කරවීමේ සියලු පියවර ගන්නවා."

# යුද හමුදා ඇඳුම්වලට සමාන ඇඳුම් නිෂ්පාදනය කළැයි චෝදනා ලැබූ හෙම්මාතගම ඇඟලුම් කර්මාන්තශාලා හිමියා නිදොස් කොට නිදහස්

බුද්ධිමාල් රුබේරු

යුද හමුදා කැලෑ ඇඳුම්වලට සමාන ඇඳුම් නිෂ්පාදනය කිරීම සහ ඇඳුම් කොටස් ළඟ තබා ගැනීමේ චෝදනා යටතේ හෙම්මාතගම ප්‍රදේශයේ ඇඟලුම් කර්මාන්තශාලා හිමියෙකුට එරෙහිව පවරා තිබූ නඩුවෙන් විත්තියේ සාක්කි නොකැඳවාම ඔහු නිදොස් කොට නිදහස් කිරීමට මාවනැල්ල දිසා විනිසුරු සහ මහේස්ත්‍රාත් අනුරාධ වීරක්කොඩි මහතා තීරණය කළේය.

විත්තිකරු මෙම අපරාධ චේතනාන්විතව ම කළ බවට ඔහුට එරෙහිව මානසික අංගයට අදාළ කිසිදු සාක්කියක් පැමිණිල්ල විසින් අධිකරණයට ඉදිරිපත් කර නොමැති බව සියලු චෝදනාවන්ගෙන් විත්තිකරු නිදොස් කොට නිදහස් කරමින් විනිසුරුවරයා සඳහන් කළේය.

දීර්ඝ නඩු විභාගයකින් අනතුරුව විත්තියේ සාක්කි නොකැඳවාම මෙලෙස නිදොස් කොට නිදහස් කරන ලද්දේ හෙම්මාතගම පල්ලිය පෝරුව පදිංචි ඇඟලුම් කර්මාන්තශාලා හිමියෙකු වන මොහම්මදු ෆරිඩ් මුම්තාජුල් හක්කු මහතාය.

2019 මැයි දෙවැනි දා හෝ ඊට ආසන්න දිනයක හෙම්මාතගමදී නිසි බලධාරියෙකුගෙන් ගන්නා ලද අවසර පත්‍රයක් නොමැතිව යුද හමුදා කැලෑ ඇඳුම්වලට සමාන නිල ඇඳුම් නිෂ්පාදනය කිරීම සහ සන්තකේ තබා ගැනීම ඇතුළු චෝදනා යටතේ හෙම්මාතගම පොලීසිය විසින් විත්තිකරුට එරෙහිව නඩු පවරන ලදි.

යුද්ධ හමුදා කැලෑ ඇඳුම්වලට සමාන ඇඳුම් විත්තිකරුට අයත් ඇඟලුම් කර්මාන්තශාලාවක මසන බවට හෙම්මාතගම පොලිස් ස්ථානාධිපතිවරයාට ලැබුණු තොරතුරකට අනුව කළ වැටලීමකදී එලෙස මසන ලද කැලෑ ඇඳුම් තොගයක් ද සමග විත්තිකරු අත්අඩංගුවට ගත් බව නඩු විභාගයේ දී හෙළි විය.

මේ සම්බන්ධයෙන් වසර 4ක කාලයක් පුරා විත්තිකරුට එරෙහිව පැවැති නඩු විභාගයේදී පැමිණිල්ල විසින් සාක්ෂිකරුවන් හතර දෙනෙකු සහ නඩු භාණ්ඩ 4ක් අධිකරණයට ඉදිරිපත් කරමින් පැමිණිල්ලේ නඩුව අවසන් කෙරිණ.

පැමිණිල්ලේ නඩුව අවසන් කළ අවස්ථාවේදී විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ චින්තක මාහනආරච්චිගේ මහතා කරුණු ඉදිරිපත් කරමින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 186 වැනි වගන්තිය යටතේ ඉල්ලීමක් කරමින් තම සේවාදායකයාට එරෙහි චෝදනා පැමිණිල්ල විසින් සාධාරණ සැකයකින් තොරව තබා කිසිදු ආකාරයකින් ඔප්පු කොට නොමැති හෙයින් විත්තිවාචක නොකැඳවා ම ඔහු නිදොස් කර නිදහස් කරන්නැයි ඉල්ලා සිටියේය.

විත්තියේ ඉල්ලීම සලකා බැලූ විනිසුරුවරයා විත්තිකරුට එරෙහිව පොලීසිය විසින් නගා ඇති චෝදනාව අනුව මහජනතාවට හෝ යම් තැනැත්තෙකුට හානියක් හෝ පාඩුවක් කිරීමේ අදහසින් රජයේ සේවකයෙකු පාවිච්චි කරන දේපලක් යම් තැනැත්තෙකු විසින් කූට ලෙස නිපදවූ බව 'මානසික අංගයද' සහිතව පැමිණිල්ල විසින් ඔප්පු කළ යුතු බව තීන්දුවේ සඳහන් කළේ ය.

ඉදිරිපත් වූ සාක්කි සලකා බැලීමේදී විත්තිකරු මෙම අපරාධය මානසික අංගය ද සහිතව කළ බවට මොනයම් හෝ කරුණකට අදාළ සාක්ෂි පැමිණිල්ල විසින් මෙහෙයවා නොමැති බව තීන්දු කළ විනිසුරුවරයා ඉදිරිපත් වූ සාක්ෂි මත මෙම අපරාධයට අදාළව විත්තිකරුගෙන් විත්තිවාචක කැඳවීමේ අවශ්‍යතාවක් මතු නොවන බවද තීරණය කළේය.

ඒ අනුව විත්තියේ ඉල්ලීම පිළිගත් මහේස්ත්‍රාත් අනුරාධ වීරක්කොඩි මහතා විත්තිවාචක නොකැඳවාම විත්තිකරු නිදොස් කර නිදහස් කිරීමට නියම කළේය. විත්තිකරු වෙනුවෙන් නීතිඥ චින්තක මාහනආරච්චිගෙ මහතා පෙනී සිටියේය.

සාරවිට.lk
සාරෙට මත්වෙන්න
www.saaravita.lk

# සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දස වැදෑරුම් විසඳුම් මාලාව රජයට ඉදිරිපත් කර මාස 18ක් ගතවෙලා

## – රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

ඉන්දික හේවාවිතාරණ

සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි ඇතිවී තිබෙන ඖෂධ ගැටලුවට හා වෛද්‍ය හිඟයට විසඳුම් ලෙස දස වැදෑරුම් විසඳුම් මාලාවක් රජයට ඉදිරිපත් කර මේ වන විට මාස 18ක කාලයක් ගතව තිබෙන බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සඳහන් කරයි.

එහෙත් පෙන්වා දුන් කරුණු පිළිබඳව හෝ දසවැදෑරුම් ප්‍රතිපත්තියේ සඳහන් කරුණු පිළිබඳව පදනම් ව විසඳුම් ලබා දීම බලධාරීන් විසින් දිගින් දිගටම නොසලකා හරිමින් සිටින බවද, එම සංගමයේ ලේකම් වෛද්‍ය හරිත අලුත්ගේ මහතා සඳහන් කළේය. පසුගිය කාලය තුළ අම්හිරි අත්දැකීම් හමාර කර ලබන වර්ෂය තුළදී හෝ රෝගී ජනතාවට සුසුම් හෙළීමකින් තොරව රජයේ රෝහලකින් සේවා ලබා ගැනීමට ඇති හැකියාව තවදුරටත් ගැටලු සහගත බවද හෙතෙම පැවසීය.

ප්‍රශ්න සහගත ඉමියුනෝග්ලොබියුලින් (Immunoglobulin) ඖෂධය ඇනවුම් කිරීමට අවසර ලබාදුන් පිරිස් කවුරුන්ද යන්න සොයා ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කඩිනමින් පරීක්ෂණයක් සිදුකළ යුතු බව බවද ඒ මහතා පැවසීය.

ගැටලු ඇති වූ ඉමියුනෝග්ලොබියුලින් ඖෂධ තොගයම භාවිතයෙන් ඉවත් කළ පසුත් ඉමියුනෝග්ලොබියුලින් ඖෂධ හිඟයක් ඇති නොවූවද, ප්‍රශ්න සහිත ඉමියුනෝග්ලොබියුලින් ඖෂධය හදිසි මිලදී ගැනීමක් ලෙස මිලදී ගෙන තිබූ බවද වෛද්‍ය හරිත අලුත්ගේ මහතා සඳහන් කළේය.

ඖෂධ තොග පිළිබඳව සියලුම තොරතුරු මධ්‍යම ඖෂධ තොග ගබඩාව සතුව පවතින බවත්, මේ අනුව ප්‍රශ්න සහගත ඉමියුනෝග්ලොබියුලින් ඖෂධයේ ඉදිරියේදී ලැබීමට නියමිත තොග නොසලකා හැර ප්‍රශ්න සහගත ඉමියුනෝග්ලොබියුලින් ඖෂධය ඇනවුම් කිරීමට නියෝගය ලබාදුන් පිරිස් හා අදාළ මිලදී ගැනීම් සඳහා අත්සන් කළ පිරිස් සොයා ගත යුතු බවද හෙතෙම පැවසී ය.

ජාවාරමේ මහ මොළකරුවන්ට උපරිම දඬුවම් ලබා දෙන අතරතුර ඖෂධ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ මතුව ඇති නව ප්‍රවණතා නිසි ලෙස කළමනාකරණය නොකළහොත් ඉදිරි කාලය තුළ සමස්ත සෞඛ්‍ය පද්ධතිය මුළුමනින්ම බිඳ වැටීමේ අවදානම මතුව තිබෙන බවද අලුත්ගේ මහතා සඳහන් කළේය.

ඒ අනුව සැබෑ වංචනිකයන්ට උපරිම දඬුවම් දෙන අතරතුර අවංකව හා සද්භාවයෙන් තම රාජකාරි ඉටු කළ හා ඉටු කරන නිලධාරීන් අනවශ්‍ය පීඩනයකට ලක් නොවන පරිදි පවතින තත්ත්වය කළමනාකරණය කිරීම මේ මොහොතේ බලධාරීන්ගේ සැබෑ වගකීමක් බවද හෙතෙම පැවසීය.

සෞඛ්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය රැකෙන අයුරින් මතුවෙමින් පවතින ගැටලුකාරී තත්ත්වය විසඳලීම සඳහා බලධාරීන් ගන්නා අවංක උත්සාහය සඳහා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ලෙස අපගේ උපරිම සහයෝගය ලබා දීමට කටයුතු කරන බවද ඒ මහතා සඳහන් කළේය.

# බලන්ගොඩ රජවක වනාන්තරයේ විශාල පරිසර හානියක් සිදුකරමින් විදුලි වැටක් ඉදිකරනවා

## පරිසර යුක්ති කේන්ද්‍රය

ඉන්දික හේවාවිතාරණ

බලන්ගොඩ රජවක වනාන්තරයේ සිටින අලි 06දෙනෙකු ගම්වැදීම වැළැක්වීම සඳහා විශාල පරිසර හානියක් සිදුකරමින් විදුලි වැටක් ඉදිකිරීමට සැලසුම් කර තිබෙන බව පරිසර යුක්ති කේන්ද්‍රය සඳහන් කරයි.

කිලෝමීටර් 57කට ආසන්න ප්‍රමාණයක විදුලි වැට ඉදිකිරීමට සැලසුම් කර තිබෙන බවත් අදාළ වැට ඉදිකිරීම සඳහා ගස් 8,338ක් ඉවත් කිරීමට ලකුණු කර තිබෙන බවද එම සංවිධානයේ ජ්‍යෙෂ්ඨ උපදේශක හේමන්ත විතානගේ මහතා සඳහන් කළේය.

විදුලි වැට ඉදිකිරීම සඳහා විශාල ගස් ඉවත් කර දැමීම අපරාධයක් බවත් කිලෝමීටර් 57ක දුරක් විදුලි වැට ඉදිකිරීම සඳහා රුපියල් කෝටි ගණනක මුදලක් වැය කරන බවට වාර්තා වන බවද පවසා සිටියේය.

එහෙත් අලි ගම්වැදීම වළක්වා ගැනීම සඳහා සත්‍ය වශයෙන්ම විදුලි වැට ඉදිකළ යුතුව තිබෙන්නේ කිලෝමීටර් 28කට වඩා අඩු ප්‍රමාණයක් වන බවට තහවුරු වී තිබෙන බවත් අලි ගම්වැදීම වළක්වා ගැනීමට වනාන්තර වටකර විදුලි වැටවල් ඉදිකිරීම අසාර්ථක කටයුත්තක් බවද සඳහන් කළේය.

දූෂිත අලි වැට ඉදිකිරීම සඳහා මේ වනවිටත් වනාන්තර කොටස තුළ බුල්ඩෝසර් යොදාගෙන වනාන්තර එළිකිරීම සිදුකරමින් තිබෙන බවත් ලංකාවේ කිසිදු අවස්ථාවක අලි වැටක් ඉදිකිරීම සඳහා බුල්ඩෝසර් යොදා වනාන්තරය එළිකිරීමක් මේ දක්වා සිදුකර නොමැති බවද පවසා සිටියේය.

දේශපාලනඥවරියකගේ ලේකම්වරයෙකු යැයි කියා ගන්නා පුද්ගලයකු අදාළ කටයුත්ත සිදුකිරීම සඳහා මැදිහත් වී සිටින බවත් අලි ගම්වැදීම වැළැක්වීම සඳහා විකල්ප ක්‍රම තිබෙන බවද සඳහන් කළේය.

මේ නිසා අදාළ විනාශකාරී වැඩපිළිවෙළ පිළිබඳව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ හා පාර්ලිමේන්තුවේ විශේෂ අවධානය යොමු කළ යුතු බවද පවසා සිටියේය.

# දෘෂ්‍යාබාධිත අය විසින්ම සුදු සැරයටි' නිපදවන කර්මාන්තශාලාවක් ඇරඹෙයි

මත්තේගොඩ ශාන්ත ප්‍රදීප් කුමාර කුලරත්න



දෑස් නොපෙනෙන ලක්ෂ හතරහමාරක් වූ දෘශ්‍යාබාධිතයන්ගේ ඇස් දෙක වන් සුදු සැරයටි' ඔවුන් විසින්ම නිෂ්පාදනය කිරීමේ sahayogya white cane production' නමින් ස්වයං රැකියා මධ්‍යස්ථානයක් හෝමාගම කිරිවත්තුඩුව මූණමලේ ප්‍රදේශයේදී ඉකුත් 02දා ආරම්භ කෙරිණි.

දෙසැම්බර් 03දාට යෙදී ඇති ජාත්‍යන්තර ආබාධිතයන්ගේ දිනයට සමගාමීව දෘශ්‍යාබාධිතයන්ගේ ජනතා සම්මේලනයේ භාණ්ඩාගාරික ප්‍රියන්ත මල්ලවආරච්චි මහතා විසින් මෙම ස්වයංරැකියා ආයතනය ආරම්භ කර තිබුණි.

මෙම ස්වයංරැකියා මධ්‍යස්ථානයෙන් දෘශ්‍යාබාධිතයන් දසදෙනෙකුට රැකියා අවස්ථා 10ක් ලැබී ඇති අතර ඒ හරහා එම පවුල්වල 70කට ආසන්න පිරිසකගේ ජීවනෝපාය පහසුකම් සලසා ගැනීමට හැකියාව ලැබීම මෙම වැඩසටහනේ විශේෂත්වයකි.

මීට අමතරව ඉදිරියේදී මෙම ස්ථානයෙන් අත්වාරු සහ රෝද පුටු නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වන අතර මෙම වැඩසටහන දිවයිනේ සෙසු දිස්ත්‍රික්ක 24 පුරාවටම ආරම්භ කිරීමට නියමිත බවත් ඒ හරහා සෘජු හා වක්‍ර රැකියා 1000ක් පමණ බිහිවීමට නියමිත බවත් මෙම වැඩසටහනේ නිර්මාතෘ ප්‍රියන්ත මල්ලවආරච්චි මහතා පැවසීය.

මෙම වැඩසටහනටසඳහා මත්තේගොඩ පියරතනාරාමාධිකාරී කොටපොල ඥානාවාස හිමි, කඩවත මහාමායා සිල්මාතා ආරාමයේ, කඩවත ධම්මදින්න මෙහෙණින් වහන්සේ, එක්සෙල් ලංකා පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ මේරි ඩෙකර්මිය, පැරා ඔලිම්පික් සම්මේලනයේ නියෝජ්‍ය සභාපති ප්‍රියන්ත රත්නායක, දෘශ්‍යාබාධිතයන්ගේ ජනතා සම්මේලනයේ ලේකම් නන්දසිරි වනිගසිංහ, දෘශ්‍යාබාධිතයන්ගේ ජනතා සම්මේලනය භාණ්ඩාගාරික ප්‍රියන්ත මල්ලවආරච්චි මහතා ඇතුළු විශේෂ අවශ්‍යතා සහිත වූවෝ විශාල පිරිසක් සහභාගී වී සිටියහ.

# කොළඹ ජාතික රෝහලේ හදිසි අනතුරු ඒකකයේ දෙවන විකිරණ යන්ත්‍රයත් බිඳවැටිලා

## – රජයේ විකිරණවිද්‍යා තාක්ෂණවේදීන්ගේ සංගමය

එච් අයි තුෂාර

කොළඹ ජාතික රෝහලේ හදිසි අනතුරු ඒකකයේ පැවැති දෙවන විකිරණ යන්ත්‍රයත් බිඳවැටීම නිසා රෝගී ජනතාව දැඩි දුෂ්කරතාවන්ට පත්වන බව රජයේ විකිරණවිද්‍යා තාක්ෂණවේදීන්ගේ සංගමය සඳහන් කරයි.

හදිසි අනතුරුවලට ලක්ව මෙම ඒකකයෙන් ප්‍රතිකාර ගැනීමට පැමිණෙන රෝගීන්ගේ සියලු විකිරණ පරීක්ෂණ සිදුකිරීම සඳහා විකිරණ යන්ත්‍ර දෙක භාවිත කළ බවත් මීට මාස දෙකකමාරකට පෙර එක් යන්ත්‍රයක් ක්‍රියා විරහිත වූ බවද එම සංගමය පෙන්වා දෙයි.

ඉන්පසුව විකිරණ පරීක්ෂණ සිදුකරනු ලැබුවේ එහි තිබූ අනෙක් විකිරණ යන්ත්‍රය භාවිත කරමින් බවත් එම යන්ත්‍රයත් මේ වන විට අක්‍රිය වී තිබෙන බවද සඳහන් කරයි.

දිවයින පුරා බරපතළ ලෙස අනතුරුවලට ලක්වන පිරිස් විශාල ප්‍රමාණයක් දෛනිකව ජාතික රෝහලට ඇතුළත් කරන බවත් මීට අමතරව හදිසි අනතුරු වාට්ටු 05 රෝගීන්ගේ විකිරණ පරීක්ෂණ පවා මෙම යන්ත්‍ර දෙක මගින් සිදුකරන බවද පෙන්වා දෙයි.

මේ අනුව පැය 24ක කාලයක් තුළදී ආසන්න වශයෙන් පරීක්ෂණ තුන්සියයත් පන්සියයත් අතර ප්‍රමාණයක් දෛනිකව සිදුකළ බවත් මේ වන විට සියලුම විකිරණ පරීක්ෂණ වෙනත් අංශවල තිබෙන යන්ත්‍ර මගින් සිදුකිරීමට යාම නිසා ගැටලු ගණනාවක් ඇති වී තිබෙන බවද සඳහන් කරයි.



මුලින්ම අක්‍රිය වූයේ ප්‍රධාන විකිරණ යන්ත්‍රය බවත් එහි ඉතා දියුණු ඩිජිටල් තාක්ෂණය ක්‍රියාත්මක වන බවත් මේ අනුව පරීක්ෂණවල වාර්තාව කෙටි කාලයක් තුළ වාට්ටුවලට, ශල්‍යාගාරය වෙතට සහ වෛද්‍යවරුන් වෙතට යොමු කිරීමේ හැකියාව පවතින බවද පෙන්වා දෙයි.

යන්ත්‍ර නඩත්තුවට අදාළ වාර්ෂික සේවා ගිවිසුම් අවසන් වීම නිසා විවිධ බිඳවැටීම් සිදුවූ පසු ඒවා යථා තත්ත්වයට පත් කිරීමට සැලකිය යුතු කාලයක් ගතවන බවද සඳහන් කරයි.

INTERNATIONAL NEWS

# සටන් විරාමය අවසන් වීමෙන් පසු එල්ල වූ ප්‍රහාරවලින් පලස්තීනුවෝ 700ක් මියයති





ඊශ්‍රායලය සහ ගාසා තීරයේ ක්‍රියාත්මක හමාස් සංවිධානය අතර දින හතක් පුරා ක්‍රියාත්මක වූ සටන් විරාම කාලය අවසන් වීමෙන් අනතුරුව ගත වූ පැය 24ක කාලය තුළදී එල්ල කෙරුණු ඊශ්‍රායල ප්‍රහාර හේතුවෙන් පලස්තීනුවන් 700 දෙනෙකු මරණයට පත්ව ඇතැයි ගාසාහි රජයේ මාධ්‍ය කාර්යාලය ඊයේ පවසා සිටියේය. මෙලෙස මියගිය පිරිස අතර දරුවන් විශාල සංඛ්‍යාවක්ද වන බව පැවසෙයි.

මෙහිදී දකුණු දිග ගාසා තීරයේ ඛාන් යුනිස් ඇතුළු ප්‍රදේශ වෙත මෙම ප්‍රහාර එල්ල වී තිබේ. එල්ල වූ ප්‍රහාර හේතුවෙන් එහි පිහිටි එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් පවත්වාගෙන ගිය පාසලක් ඇතුළු තවත් ගොඩනැගිලි රැසක්ම විනාශ වී තිබේ. මේ අතර ගාසා තීරය වෙත පහරදීම සඳහා එක්සත් ජනපදය ගුවන් මගින් බෝම්බ 15,000ක් සහ අනෙකුත් අවි 57,000ක් පමණ එවූ බවත් සඳහන් වෙයි. ඒ අතර බංකර විනාශ කරන බෝම්බද වන බව පැවසෙයි.

ඊශ්‍රායලය සහ හමාස් සංවිධානය අතර දින හතක් පුරා ක්‍රියාත්මක වූ මෙම සටන් විරාම කාලසීමාවේදී හමාස් සංවිධානයේ ප්‍රාණ ඇපයේ සිටි 90කට ආසන්න පිරිසකට නිදහස හිමි විය. එසේම ඊශ්‍රායල බන්ධනාගාරවල සිටි පලස්තීනුවන් 150කට ආසන්න පිරිසකටද නිදහස හිමි විය. කෙසේ වෙතත් තම භාරයේ සිටින ඉතිරි ප්‍රාණ ඇපකරුවන් නිදහස් කිරීම ඊශ්‍රායලය ගාසා වෙත එල්ල කරන ප්‍රහාර අනුව තීරණය වන බව හමාස් සංවිධානය පවසා ඇත.

# අයිෆල් කුළුන අසල ප්‍රහාරයකින් ජර්මානු සංචාරකයෙකු මරුට

ප්‍රංශයේ පැරිස් අගනුවර පිහිටි අයිෆල් කුලුන ආසන්නයේදී සෙනසුරා රාත්‍රියේදී සිදු වූ පිහි සහ මිටි ප්‍රහාරයකින් පුද්ගලයෙකු මරණයට පත්ව තවත් දෙදෙනකු තුවාල ලබා ඇතැයි වාර්තා වෙයි. අදාළ ප්‍රහාරකයා 26 හැවිරිදි ප්‍රංශ ජාතිකයෙකු ලෙස හඳුනාගෙන ඇති අතර, ඔහු සංචාරකයන් ඉලක්ක කරගනිමින් ප්‍රහාරය එල්ල් කර ඇතැයි සඳහන් වෙයි. මෙහිදී ඔහු "අල්ලාහු අක්බර්" ලෙස ප්‍රකාශ කරමින් ප්‍රහාරය සිදුකළ බව ඇසින් දුටුවෝ පවසති.

මෙම පුද්ගලයා 2016 වසරේදී සැලසුම් කළ මෙවැනිම ප්‍රහාරයක් සම්බන්ධයෙන් වසර හතරක බන්ධනාගාරගතවීමකට ලක්ව සිටි අයෙකු බවත් පැවසෙයි. එසේම ඔහු සතුව යම් මානසික ව්‍යාකූලතාවක් පැවති බවත් අනාවරණය වී තිබේ. විශේෂයෙන්ම ඇෆ්ගනිස්තානය සහ පලස්තීනය තුළ මුස්ලිම් ජාතිකයන් මරණයට පත්වීම සම්බන්ධයෙන් ඔහු දැඩි පීඩාවට පත්ව සිටි අයෙකු ලෙසත් හඳුනාගෙන ඇත.

# කුරුළු උණ නිසා ආර්ජන්ටිනාවේ ෆ්ලෙමින්ගෝ 220ක් මිය ගිහින්



ආර්ජන්ටිනාව තුළ ව්‍යාප්ත වෙමින් පවතින කුරුළු උණ රෝගී තත්ත්වය හේතුවෙන් මේ වනවිට එරට වයඹදිග කාටාමාර්කා පළාතේ වාසය කළ ෆ්ලෙමින්ගෝ පක්ෂීන් 220ක් පමණ මියගොස් ඇතැයි වාර්තා වෙයි. මේ වන විට එම කුරුළු උණ රෝගී තත්ත්වය ආර්ජන්ටිනාවේ සාගර ආශ්‍රිත පක්ෂීන් අතර වේගයෙන් ව්‍යාප්ත වෙමින් පවතින බව සඳහන් වෙයි. ඒ අනුව පාත්තයන්, මුහුදු ලිහිනියන් සහ හංසයන් මෙලෙස ආසාදිත පක්ෂීන් ලෙස හඳුනාගෙන ඇති අතර, අනෙකුත් පක්ෂීන් වෙතද එය බෝවීමේ අවස්ථාවක් පවතින බව සඳහන් වෙයි.

මේ අතර ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුවද 2022 වසරේ සිට මේ දක්වා ලොව පුරා රටවල් 80කදී මෙම කුරුළු උණ රෝගී තත්ත්වය හඳුනාගෙන තිබේ. ඒ අනුව ඉදිරියේදී ලොව තවත් ප්‍රදේශ වෙතද මෙම වෛරසය ව්‍යාප්තවීමේ හැකියාවක් පවතින බවටත් අනතුරු අඟවා තිබේ. මෙලෙස ආර්ජන්ටිනාව තුළ මියගොස් ඇති ෆ්ලෙමින්ගෝ පක්ෂීන්, ජේම්ස් ෆ්ලෙමින්කෝ හෝ පූනා ෆ්ලෙමින්ගෝ ලෙස හඳුනාගෙන තිබේ.

# රුසියානු හමුදාවට තවත් අලුතින් සෙබළුන් 170,000ක් බඳවා ගැනීමට අනුමැතිය

## මේ සමගම රුසියාවේ යුද හමුදා සෙබළුන් සංඛ්‍යාව ලක්ෂ 13 ඉක්මවාවිලු



රුසියාවේ හමුදා සෙබළුන් සංඛ්‍යාව තවත් 170,000කින් ඉහළ නැංවීමට රුසියානු ජනාධිපති ව්ලැදිමීර් පූටින් නියෝග ලබාදී ඇතැයි වාර්තා වෙයි. ඒ අනුව එරට සේවා නියුක්ත හමුදා සෙබළු සංඛ්‍යාව ලක්ෂ 13.2ක් දක්වා ඉහළ යන බව සඳහන් වෙයි. එසේම ඉදිරියේදී රුසියානු හමුදාවේ සමස්ත සාමාජිකයන් සංඛ්‍යාව ලක්ෂ 22ක් බවට පත්වනු ඇතැයිද වාර්තා පවසයි.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වා ඇති රුසියානු ආරක්ෂක අමාත්‍යවරයා, "මෙලෙස රුසියානු හමුදාවේ ශක්තිය තවදුරටත් ඉහළ නැංවීමට මූලිකම හේතුව වී ඇත්තේ රුසියාව සිදුකළ විශේෂිත හමුදාමය මෙහෙයුම් සහ නේටෝ සංවිධානය තුළ සිදුවන පුළුල්වීමයි." යනුවෙන් පවසා තිබේ. වාර්තා සඳහන් කරන ආකාරයට මේ වසරේ ජනවාරි 01 වැනිදා සිට දෙසැම්බර් 01 වැනිදා දක්වා කාලය තුළදී පමණක් කොන්ත්‍රාත් පදනම මත රුසියානු හමුදාව වෙත 452,000 ක් බඳවා ගෙන තිබේ.

# දේව මෙහෙයක් පැවැති විශ්වවිද්‍යාල ක්‍රීඩාගාරයක පිපිරීමකින් 11 ක් මරුට



පිලිපීනයේ දකුණු දිග මරාවි නගරයේ පිහිටි මින්ඩනාඕ රාජ්‍ය විශ්වවිද්‍යාලයේ ක්‍රීඩාගාරයක් තුළ ඊයේ සිදු වූ පිපිරීමකින් පුද්ගලයෝ 11 දෙනෙකු ජීවිතක්ෂයට පත්ව තවත් පිරිසක් තුවාල ලබා ඇතැයි වාර්තා වෙයි. මෙම පිපිරීම සිදුවන අවස්ථාවේදී එම ක්‍රීඩාංගණය තුළ කතෝලික දේව මෙහෙයක් පැවැත්වෙමින් තිබී ඇත. මෙම ප්‍රහාරය හෙළා දැක ඇති පිලිපීන ජනාධිපති කණිෂ්ට ෆර්ඩිනාන්ඩ් මාර්කෝස්, සිදුවීම සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ලෙස උපදෙස් ලබා දී තිබේ. මෙය එම පළාතේ ක්‍රියාත්මක ඉස්ලාම් රාජ්‍ය සංවිධානයට හිතවාදී ත්‍රස්තවාදී කණ්ඩායමක ප්‍රහාරයක් ලෙස සැලකෙයි.

# ජර්මනියේ දරුණු හිමපතනයෙන් ගුවන් සහ දුම්රිය ගමන් අවලංගුයි



ජර්මනියේ මියුනික් අගනුවර පිහිටි බවාරියා පළාත වෙත බලපා ඇති දරුණු හිමපතනය හේතුවෙන් එහි ගුවන් සහ දුම්රිය ගමන් රැසක් අත්හිටුවීමට බලධාරීන් තීරණය කර ඇතැයි පවසයි. ඒ අනුව එරට මියුනික් අගනුවර ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ සිට ගුවන්ගත වන සහ ඒ වෙත පැමිණෙන ගුවන් යානා සියල්ලම ඊයේ දිනය පුරාම අවලංගු කෙරී තිබූ බව සඳහන් වෙයි. එසේම මියුනික් දුම්රිය ස්ථානය වෙතද කිසිදු දුම්රියක් පැමිණීම හෝ පිටවීම සිදු නොවුණු බව සඳහන් වෙයි. පළාත තුළ පතිත වී ඇති සෙන්ටිමීටර් 30ත් 40ක් පමණ ඝනකම් හිම තට්ටු හේතුවෙන් මාර්ග අනතුරු රැසක්ම සිදුව තිබේ.

# පාකිස්තානයේ බස් රථයකට එල්ල වූ ප්‍රහාරයකින් නව දෙනකු ජීවිතක්ෂයට



පාකිස්තානයේ උතුරු දිග පිහිටි ගිල්ගිට් බල්ටිස්ටාන් පළාතේ චිලාස් ප්‍රදේශය හරහා ධාවනය කෙරෙමින් තිබූ බස් රථයක් වෙත එල්ල වූ නාඳුනන වෙඩි ප්‍රහාරයකින් පුද්ගලයෝ නව දෙනෙකු මරණයට පත්ව තවත් 25කට ආසන්න පිරිසක් තුවාල ලබා ඇතැයි පොලීසිය පවසයි. මියගිය පිරිස අතර පාකිස්තාන සෙබළුන් දෙදෙනකුද වෙයි. මෙම බස් රථය මගින් ගිල්ගිට් හි සිට රාවල්පින්ඩි දක්වා මගීන් ප්‍රවාහනය කරමින් සිටියදී මෙම ප්‍රහාරයට ලක්ව තිබේ. එම අවස්ථාවේදී රියදුරාගේ පාලනයෙන් රථය මිදී ට්‍රක් රථයක ගැටී ඇති අතර, ඒ සමගම රථ දෙකම ගිනිගෙන ඇත. එහිදී රථ දෙකෙහිම රියදුරන් මරණයට පත්ව ඇතැයි සඳහන් වෙයි.

